දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.

තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

තමිළිනීගේ කතාව

16

වයසට යමින් සිටි බව නොදත් කොටි තරුණියන්ගේ සහ අසරණයන්ගේ ඉරණම

කාන්තා සාමාජිකාවන්ගේ විවාහයන් සහ විවාහයට පසුව ඔවුන්ගේ අඛණ්ඩ ක්‍රියාකාරකම් පිළිබඳව බොහෝ ප්‍රශ්න ඇතිවිය. සංවිධානය තුළ සටන්කාමී ස්ත්‍රී පුරුෂ ප්‍රේම සම්බන්ධතා සහ විවාහ සම්බන්ධතා ඇතිවිය. විමුක්ති කොටි සංවිධානයෙහි විවාහ කටයුතු පිළිබඳ කණ්ඩායමේ නායකත්වයට නායකතුමා විසින් දේශපාලන උපදේශක ඇන්ටන් බාලසිංහම්ව 1991 වසරේ දී පත්කරනු ලැබුවේය. එම තනතුරේ තමන්ට තවදුරටත් කටයුතු කළ නොහැකි බව පවසා ඔහු ඊළඟ වසරේදීම එයින් ඉවත් විය. පසු අවස්ථාවක ඒ සඳහා හේතු වූ කරුණු ඔහු මෙසේ හෙළි කළේය.

'කසාද බඳින වයසට ආව කාන්තාවෝ නොඩක් සංවිධානේ ඉන්නවා. සටන් කරලා තුවාල වෙලා අවයව අහිමි වෙච්ච සටන්කාමී කාන්තාවෝ ඉන්නවා. මේ අයව කසාද බඳින්ඩ සංවිධානේ ඉන්න පිරිමි සාමාජිකයෝ ඉදිරිපත් වෙන්ඩ ඕනෑ. අපේ කොල්ලන්ගෙන් සමහරු තමන් එක්ක එකතුවෙලා සටන් කරපු ගෑනු ළමයින්ව කසාද බැඳීම ගැන හිතන්නේ නැතිව ලස්සන, හොඳ රස්සාවල් කරන, එහෙම නැත්තන් පිටරට නෑදෑයෝ ඉන්න පවුල්වල ගෑණු ළමයි හොය හොයා ඇවිදිනවා. ඒ වගේ කසාද බැඳීම්වලට මාව අවශ්‍ය නැහැ කියලා නායකතුමාට කියලා මං අයින් වුණා'

පසුගිය කාලයේදී ස්ත්‍රී පුරුෂ දෙදෙනාම දිරිමත් කළේය. ඉහළ සෙන්පති තනතුරු දැරූ අය සංවිධානයේ කාන්තාවන් කැමැත්තෙන් විවාහ කර ගත්හ. අනෙකුත් සටන්කාමීන් අතර පවා ප්‍රේම සම්බන්ධතා සහ විවාහ ස්වාභාවිකව ඇතිවන්නට විය. සාමාජිකයන් ප්‍රේම සම්බන්ධතා ඇති කර ගැනීමේදී තම වගකීම් භාර තනතුර දරන සටන්කාමී සාමාජිකයන් වන අයගේ විවාහ අයගේ මාර්ගයෙන් එය නායකත්ව මූලස්ථානයට ඇනුම් දිය යුතුය. විවාහයට පෙර ඔවුන් ලිංගික සම්බන්ධතා පැවැත්වීම දැඩි දඬුවම් හිමිවන වරදක් විය. පිරිමි අයගේ විවාහ විය හැකි වයස අවුරුදු විසි නවය වූ අතර කාන්තාවන්ගේ වයස අවුරුදු විසි තුන විය. මේ අතර දෙදෙනා හෝ එක් අයෙක් හෝ අනිවාර්යයෙන්ම අවුරුදු පහකට වඩා සංවිධානයෙහි සේවය කර තිබීම අවශ්‍ය විය.

සටන්කාමී සාමාජික සාමාජිකාවන්ගේ සමහර විවාහවලදී කුලය පිළිබඳ සැඟවුණු මතයන් අවධාරණය කර තිබුණි. එහෙත් බොහෝ සටන්කාමීහු මෙම බාධක තරණය කර විවාහ වී සාර්ථක පවුල් ජීවිතයක් ගත කළහ. අපේ පවුලේ ආච්චි එනම් අම්මාගේ අම්මා කුල භේදය සලකන්නියක් වූවාය. අපේ නිවෙසේ වැඩ කිරීමට පැමිණෙන අයෙකුට ආච්චි බීමට වතුර දෙන්නේ බෝතලයක බව මගේ නිරීක්ෂණයට ලක්විය. දිනක් වතුර ඉල්ලා සිටි මොහොතේ ආච්චිට පෙර මම වතුර බොන සෙම්බුවේම වතුර ගෙනැවිත් දුන්නෙමි. ආච්චි ඉතාමත් දැඩි සේ කෝපයට පත්වූවාය. මා සමග කිසිවක් කතා නොකළ අතර ආච්චි එම සෙම්බුව එළියට විසි කළාය. සමාජයෙහි කුලය යන්න මහත් බලවත් ප්‍රශ්නයක් බව මට එවිට තේරුම් ගියේය.

සංවිධානයට බැඳී යාපනයෙහි දේශපාලන වැඩ කටයුතු සඳහා ජනතාව අතරට ගිය මොහොතේ උගත් වැදගත් මිනිසුන් පවා කුල මඩ ගොහොරුවේ වැටී සිටින සමාජ ක්‍රෑරත්වය මම දුටුවෙමි. එය මා තුළ මහත් කම්පනයක් ඇති කළේය. කේ. ඩානියල් ලේඛකයාගේ නිර්මාණ මගින් කුල ක්‍රෑරත්වය සමාජයෙහි බහුලව පවතින ආකාරය අවබෝධ කරගත්තෙමි. අපට රටක් ලැබුණු වහාම මේ සඳහා වන දැනුම්වත් කිරීමේ වැඩසටහන් ජනතාව අතර සිදුකිරීමේ අවශ්‍යතාව මම මගේ සටන්කාමී යෙහෙළියන් සමග කතා බහ කළෙමි. සටන්කාමීහු බොහෝ දෙනෙක් කුල ක්‍රමය මුළුමනින්ම පිළිකුල් කළහ. එමෙන්ම එයට එරෙහිව සටන් කිරීමේ අවශ්‍යතාව අවබෝධ කර ගත්හ. ආයුධ පුහුණුව ලබා සටන්කාමියෙකු බවට පත්ව සිටිය ද සමරුන්ගේ හිත් තුළ ජාතිය, ආගම, අනවශ්‍ය සම්ප්‍රදායයන්, මිථ්‍යා විශ්වාස යනාදිය කිසිම ප්‍රමාණයකින්වත් වෙනස්ව තිබුණේ නැත.

මෙවැනි තත්ත්වයක් පවතිත්දී වයසින් ඉතාමත් වැඩි සටන්කාමී පිරිමින් ඔවුන්ට වඩා බොහෝ වයස අඩු සටන්කාමී තරුණියන්ව විවාහ කර ගැනීමට අවසරය ඉල්ලා සිටින අවස්ථාවල උභතෝකෝටික ප්‍රශ්න ඇතිවීම ස්වාභාවිකය. එහෙත් එවැනි අවස්ථාවන්හිදී තීරණ ගැනීමේ බලය සටන්කාමී සාමාජිකාව සතුවිය. සමහර සෙන්පතිවරු තමන්ගේ සටන්කාමීන් සඳහා වන නිර්දේශ කිරීම් ඇති කරන විට බොහෝ ගැටුම් ඇතිවීම ස්වාභාවිකය. එහෙයින් කාන්තා පාර්ශ්වයෙහි වගකීම්භාර අයට අධිකව පීඩනයක් ඇති වෙයි. විවාහ වී දෙදෙනාම සේවය සඳහා යන සටන්කාමී පවුල්වල දරුවන් බලා ගැනීම සඳහා ආරක්ෂක ස්ථානයක් ඇති කිරීම පිළිබඳ උපදේශයට අනුව එම වගකීම මා වෙත පැවරුණි. ඒ අනුව පළමු වතාවට පුදුකුඩුයිරුප්පුවෙහි 'තලිර් කුලන්දෛහල් කාප්පගම්' (ළදරු ළමා සුරැකුම් මධ්‍යස්ථානය) බිහිවිය.

මේ අතර සාමාජිකයන් විවාහවිය යුතු වයස පසුකළ හා ආබාධිත අවිවාහක සටන්කාමී කාන්තාවෝ ද බොහොමයක් උන්හ. සංවිධානයේ අනවරත වැඩ කටයුතුවල දැඩි ලෙස යෙදී සිටි හෙයින් තමන් වයසට යමින් සිටින බව හෝ ජීවන සහකරුවෙකු සොයාගැනීම පිළිබඳව හෝ ඔවුනට හැඟීමක් නොවීය. සංවිධානය ඔවුන් සඳහා ආරක්ෂාවත්, මූලික අවශ්‍යතාවයනුත්, සටන්කාමී සාමාජිකාවක්ය යන සමාජ තත්ත්වයක් ලබාදී තිබුණි. මා දන්නා බොහෝ සටන්කාමී සහෝදරියෝ විවාහ නොවී දිගටම අරගලයට දායකත්වය දැක්වීමට කැමැත්ත දැක්වූහ. මෙහි දී සංවිධානය ඔවුන්ගේ කැමැත්තට ඉඩ දුන්නේය.

සටන් බිමෙහි අධික ලෙසින් කාන්තාවන් ක්‍රියාත්මක වුවත් අදාල අංශයෙහි අණදෙන නිලධාරි බලය සහිත අය ලෙස පිරිමින්ම උන්හ. දීර්ඝ සටන් අත්දැකීම් ඇති සෙන්පති කාන්තාවන් ස්ත්‍රී පුරුෂ සටන්කාමීන්ට අණ දෙන නිලධාරිවරුන් ලෙස නායකතුමා පත් කර තිබුණි. කර්නල් විදූෂා, කර්නල් දුර්ගා යන අයට සටන් බිමේ වගකීම් කොටස් කර දී තිබුණි. මේ අයුරින් විමුක්ති කොටි කාන්තා සටන්කාමීන්ගේ වර්ධනය මිලිටරිමය ව්‍යුහය තුළ ඇති වී තිබුණි.

1992 වසරේ මැයි මාසයේදී යාපනයේ වින්සන්ට් තියෙටර් හිදී විමුක්ති කොටි සංවිධානයේ කාන්තා පෙරමුණේ කාන්තා මහ සමුළුවක් පවත්වා වැදගත් යෝජනා දහයක් ස්ථිර කරගත්තෙමු. එයින් ප්‍රධාන එකක් වූයේ 'දෑවැද්ද තහනම්' යන්නයි. දෙමළ සමාජයට අනුව කාන්තාවන් පමණක් නොව මුළු

36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com